පුදුකුඩිඉරුප්පු ප්‍රදේශිය සභාව

මුලතිව් දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 26 දින විගණන සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 19 දින ඉදිරිපත් කරන ලදි . වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2012 මැයි 14 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි .

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව පුදුකුඩිඉරුප්පු ප්‍රාදේශිය සභාව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනයන්ට කෙරෙන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට පුදුකුඩිඉරුප්පු ප්‍රාදේශිය සභාවේ වැඩ කටයුතු වල තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් වල මූල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහයන් පිළිබඳව සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ .

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

( අ ) අයවැය ලේඛණය සහ මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා ඇති තථ්‍ය සංඛ්‍යාවන් අතර වෙනස්කම් සඳහා හේතු ඉදිරිපත් කර නොතිබුණි .

( ආ ) මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනයන් හි අනාවරණය කර නොතිබුණි .

1.3.2 . ගිණුම්කරණ අඩුපාඩු .

ආදායම් සහ වත්කම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනයන් හි නිරික්ෂණය වූ ගිනුම්කරණ අඩුපාඩු පහත වගුවෙහි දක්වා ඇත .

| මූල්‍ය ප්‍රකාශයන් කෙරෙහි බලපෑම | ආදායම් | | වත්කම් | |
|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම |
| | | රු. | | රු. |
| අඩුවෙන් දැක්විම් | - | - | 02 | 18,624,761 |
| වැඩියෙන් දැක්විම් | 04 | 3,780,306 | 01 | 4,721 |

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරිම නිසා එකතුව රු . 6,986,786 ක් වූ ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරිමට නොහැකි විය .

2 මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් අනුව , 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම් රු. 3,028,052 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු . 3,141,212 ක් විය.

2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන අඩුපාඩු නිරික්ෂණය විය .

(අ) උතුරු නැගෙනහිර පළාත් සේවා වැඩිදියුණු කිරිමේ ව්‍යාපෘතිය විසින් වෙන් කරන ලද රු. 44,000,000 ක් වූ සංවර්ධන සංචිතය අදාළ කටයුත්ත සඳහා යොදා ගෙන නොතිබුණි .

(ආ) විවිධ ණය හිමියන් ලෙස ගිණුම්ගත කරන ලද රු. 50,000 ක් වු ණය ශේෂය පියවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2010 වර්ෂයට අදාළ රු. 4,003 ක් වු දුරකථන බිල්පත පියවීම සඳහා කටයුතු කර නොතිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිග ආදායම .

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිග ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය . | ඇස්තමේන්තුගත . | තථ්‍ය . | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිග ආදායම |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| i | වරිපනම් සහ බදු | 90,000 | 67,103 | - |
| ii | බදු කුලී | 10,296,000 | 2,419,580 | - |
| iii | බලපත්‍ර ගාස්තු | 990,000 | 262,883 | - |
| iv . | වෙනත් ආදයම් | 16,501,960 | 9,243,173 | 6,304,882 |

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

(අ) පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරින්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වු උසාවි දඩ ප්‍රමාණය රු. 1,592,168 ක් විය .

(ආ) 2011 වර්ෂය සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අයවිය යුතු මුද්දර ගාස්තු ගණනය කර ගිණුම් ගතකර නොතිබුණි .

2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් සනාථ නොවු ගනුදෙනු

(අ) උතුරු නැගෙනහිර පළාත් සේවා වැඩිදියුණු කිරිමේ ව්‍යාපෘතියේ කටයුතු සඳහා 2011 ජුලි 05 දින ගෙවන ලද රු. 10,000 ක් වු බස් ගාස්තු සඳහා අධිකාර බලය ලබා දි නොතිබුණි .

(ආ) පූර්ව අනුමැතියකින් තොරව ලේකම්වරයාට සහා අරමුදලෙන් රු. 84,459 ක් වු වැඩ බැලීමේ වැටුප් ගෙවා තිබුණි .

2.5 මෙහෙයුම්/ කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ .

(අ) 2005 සහ 2006 වර්ෂය සඳහා විශ්‍රාම වැටුප් අඩුකිරීම් රු. 113,598 ක් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයා වෙත ගෙවා නොතිබුණු අතර විවිධ තැන්පතු ගිණුමෙහි තැන්පත් කර තිබුණි.

(ආ) වැඩසටහන් සහකාර වෙත ගෙවා තිබුණ රු.46,832 ක් වු වැටුප් විවිධ තැන්පතු ගිණුමට මාරු කර තිබුණි.

(ඇ) ප්‍රජා මධ්‍යස්ථානය සඳහා පළාත් පාලන කොමසාරිස්වරයා විසින් ලබා දී තිබුණු රු. 164,937 ක් වූ ප්‍රදානය අපේක්ෂිත අරමුණ සඳහා යොදවා නොතිබුණු අතර එය විවිධ තැන්පතු ගිණුමට මාරු කර තිබුණි .

(ඈ) රු. 91,975 ක් වූ සේවක භාරකාර අරමුදල් සහ සේවක අර්ථසාධක අරමුදල් අඩුකිරීම් සේවක භාරකාර අරමුදලට සහ සේවක අර්ථසාධක අරමුදලට ප්‍රේෂණය කර නොතිබුණු අතර ඒ වෙනුවට එම මුදල විවිධ තැන්පතු ගිණුමට මාරු කර තිබුණි .

(ඉ) වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා අඩුකර ගන්නා ලද රු. 2,787 ක් වැන්දඹු සහ අනත්දරු අරමුදලට ප්‍රේෂණය කර නොතිබුණු අතර එම මුදල විවිධ තැන්පතු ගිණුමට මාරු කර තිබුණි.

2.6 කාර්ය සධනය

------------------

ව්‍යාපෘති 06 ක් සඳහා රු. 2,300,000 ක් වූ අයවැය ප්‍රතිපාදන සලසා තිබුණු නමුත් 2011 වර්ෂය තුලදි එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

3 . පද්ධති හා පාලන .

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය .

( අ ) ආදායම් රැස් කිරිම

( ආ ) ස්ථාවර වත්කම්

( ඇ ) ගිණුම්කරණය

(ඈ) මානව සම්පත්

(ඉ) වාහන උපයෝජනය

(ඊ) විවිධ තැන්පතු

(උ) අයවැය පාලනය